# ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

# අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන ප්‍රතිපත්ති) තනතුර

## ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS), 1 වන පන්තිය

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, 1 වන පංතියේ, ස්වයං උද්යෝගී, ප්‍රතිඵල කෙරෙහි නැඹුරු ක්‍රියාශූර නිලධාරීන් වෙතින්, රාජ්‍ය ආයතන මගින් භාණ්ඩ, සේවා, කර්මාන්ත, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය පිළිබඳව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටි සම්පාදනය කිරීමේ විෂය භාරව සිටීමට අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන ප්‍රතිපත්ති) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **01.** | **සේවා සුදුසුකම්** | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පංතියේ නිලධාරියකු විය යුතුය. (දැනට සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් නොලැබුනහොත් විශ්‍රාමික නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බැලේ. |
| **02.** | **අධ්‍යාපන සුදුසුකම්** | i. කළමනාකරණ / නීති / විද්‍යා / ආර්ථික ක්ෂේත්‍රයන් හි හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය.<br>ii. රාජ්‍ය ප්‍රතිපත්ති / රාජ්‍ය කළමනාකරණය / මූල්‍යමය කළමනාකරණය / ඇගයීම හා අධීක්ෂණය / රාජ්‍ය පරිපාලනය / සංවර්ධන ආර්ථිකය හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධි සුදුසුකම්.<br>iii. Miloda, SLIDA, CIDA හෝ ICTAD වෙතින් රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව. |
| **03.** | **අවශ්‍ය පළපුරුද්ද** | ★ රජයේ ප්‍රසම්පාදනවලට අදාළ ප්‍රතිපත්ති / මාර්ගෝපදේශ / ක්‍රියාපටිපාටි පිළිබඳ පළපුරුද්ද.<br>★ ප්‍රසම්පාදන කමිටුවක (PC) / තාක්ෂණ ඇගයීම් කමිටුවක (TEC) සභාපති / සාමාජික ලෙස සේවය කිරීමේ පළපුරුද්ද. |
| **04.** | **නිපුණතා** | i. වාර්තා ලිවීමේ නිපුණතා<br>ii. විශ්ලේෂණාත්මක නිපුණතා<br>iii. සන්නිවේදන සහ අන්තර් නිපුණතා<br>iv. තොරතුරු සන්නිවේදන තාක්ෂණ ICT නිපුණතා |
| **05.** | **අයදුම් කිරීමේ ක්‍රියාමාර්ග** | i. දැනටමත් රජයේ සේවයේ නියුතු අයගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.<br>ii. අයදුම්පත්, ඉහත 1-4 හි දක්වා ඇති සුදුසුකම්, පළපුරුද්ද ආදිය ප්‍රකාරව අයදුම්කරුගේ යෝග්‍යතාව පැහැදිලි කෙරෙන විස්තීර්ණ ජීව තොරතුරු ප්‍රකාශයක් හා සමග ආවරණ ලිපියකින් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ගෙන් සමන්විත විය යුතුය.<br>iii. ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ "**අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන ප්‍රතිපත්ති) තනතුර සඳහා අයදුම්පත**" යනුවෙන් සඳහන් කොට, 2020 ජූලි 24 වැනිදට හෝ ඊට පෙර "**මහලේකම්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, නො. 145, කෙළින් වීදිය, බත්තරමුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. |
| **06.** | **තෝරාගැනීමේ ක්‍රියාදාමය** | කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඉහත කී උපමානයන් සහ සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය මත පදනම්ව කොමිෂන් සභාව මගින් සුදුසු නිලධාරීවරයා තෝරාගනු ඇත. |
| **07.** | **වැටුප් හා ප්‍රතිලාභ** | i. තෝරාගනු ලබන අයදුම්කරු දැනට සේවයේ නියුතු නිලධාරියකු නම් ඔහුට සමාන SL-1 වැටුප, ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව (මූලික වැටුපින්) 25% ක දීමනාවක් සහ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව වෙනත් දීමනාවන්ද හිමිවන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ස්ථාන මාරුවක් ලබා දෙනු ඇත.<br>ii. තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ අයෙක් නම් අංක 03/2018 චක්‍රලේඛයට අනුව නියමිත වැටුප සහ ඉහත "i" හි දක්වා ඇති වෙනත් දීමනා ද හිමිවේ. කෙසේ වෙතත්, පත්වීම කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරේ. |

**මහ ලේකම්**
**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.**